# පිටසක්වල මිතුරිය




නෙත්යා දම්සාරි සමරකෝන්
ශාන්ත ජෝශප් බාලිකා මහා විදුහල
(ගම්පොළ)
6 වසර

# පිටසක්වල මිතුරිය

නෙත්යා දම්සාරි සමරකෝන්

ISBN = 978-624-206-575-5
bar code - 9 786242 065755
පළමු පළ කිරීම 2023 - නොවැම්බර්

නෙත්යා දම්සාරි සමරකෝන්
අංක 14/1 ගම්පොළවත්ත
ගම්පොළ
දුරකථන අංකය - 076 962 6414

# පිදුම

විද්‍යුත් පොතක් සම්පාදනය
සඳහා මා හට මඟ පෙන් වූ
මහනුවර මහමායා බාලිකා
විදුහලේ ගරු විදුහල් පති
තුමියටත් නිබඳව ම මා දිරි ගැන්
වූ සෙනෙවිරත්න මහා ලේකම්
ගේ ගුරු පියානණ්ටත් මා
ඉගෙනුම ලබන ගම්පොළ
ශාන්ත ජෝශප් විදුහලේ ගරු
විදුහල්පතිතුමිය ඇතුළු මාගේ
ආදරණීය ගුරු මව්වරුන්ටත්
පියවරුන්ටත් මාගේ
සෙවණැල්ල සේ මා පසු පස
සිටින ආදරණීය මවටත්
පියානණ්ටත් සෙනෙහසින්
පිළිගන්වමි!

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

එක් දිනක උදෑසන මිදුලේ ඇවිදිමින් සිටින විට මිදුලේ ඈත කෙළවරේ ගස් අතරින් එහෙට මෙහෙට යන අද්භූත මිනිසෙක් මා දුටුවා. සිතට බයක් දැනුනත් මා ඔහු සිටින දෙසට පිය නැගුවා.



අමුතු රූපයක් ලොකු ඇස් තියෙන ඇය මා දැක ඈතට දිව ගියා. මමද ඇය පසුපස දිව ගියා. “බය වෙන්න එපා , පොඩ්ඩක් නවතින්න . මම ඔයාට උදව් කරන්නම්”.



ඇය නැවතී මා දෙස බලා
සිටියා."පුදුමයි!" ඇය
පිටසක්වල ජීවියෙක්."ඔයා
කොහොමද මෙහෙට ආවේ?"
මම ඇයගෙන් ඇසුවා. ඈ
හඬමින් කීවේ ඇය පැමිණි
යානය ඇයට මඟ හැරුණු බව.



“ඔයා අඬන්න එපා” යැයි කියූ මම ඇයගේ නම ඇසුවා. “මගේ නම ජේනී” යැයි පැවසුවා.ඔයා ඔහොම ටිකක් ඉන්න. මම ඉක්මනින් ගෙදර ගිහින් එන්නම්.



ජේනී පුදුමයෙන් වගේ බලන් ඉඳලා
මේ කොහෙද ? කියා මගෙන් ඇහුවා.
අපිට වෙන වෙනම ජීවත් වෙන්න
නිවාස ඇති බවත් මේ නිවස මගේ
බවත් පැවසුවා. ඇය සතුටින් මා
සමග සමඟ නැවතීමට කැමැති වුණා



අපි දෙදෙනා ටිකවේලාවකින් හොඳම
මිතුරියන් බවට පත්වුණා. දවසම
මම ඇය සමඟ සෙල්ලම් කළා.
ඇයගේ දුක ටිකෙන් ටික නැති වුණා.
මහන්සි වුනා අපි දෙදෙනා ඇඳට වැටී
නිදා ගත්තා.



උදෑසන අවදි වුන මම ජේනීව තනිකර පාසලට යා යුතු බව පැවසුවා. ඇයට තනිව සිටීමට නොහැකි බවත් ඇයවත් පාසලට රැගෙන යන ලෙස මගෙන් ඉල්ලා සිටියා.



මට එසේ කළ නොහැකි බවත් පාසලේ මා වැනි ළමුන් ගොඩක් සිටින බවත් ඔවුන් ඇයට කරදරයක් කළ හැකි බවත් කියා සිටියා ඇය එවිට මට කිව්වේ ඇයට කාටවත් නොපෙනී සිටීමට හැකි බලයක් ඇති බවයි මම ඒ අසා පුදුම වුණා




ඇයව තනිකර පාසල් යාමට මටත්
කැමැත්තක් නොතිබුණනිසා මම
ජෙනීව මගේ පාසලට එක්කන්
ගියා.ඇය එදින මම යාළුවන්
යහළුවන් සමග සෙල්ලම් කරන
අයුරු බලා ගොඩක් සතුටු වුණා.



පසුදින සිට පාසල් නිවාඩු
කාලය ආරම්භ වූ නිසා මමත්
ජෙනීත් ඇති තරම් විනෝදයෙන්
කාලය ගත කළා.



කාලය දිනෙන් දින ගෙවී ගියා.
එදා ගොඩක් බය හිතුනා
වගේම දුක හිතුණ දවසක් ඒ
මොකද අමුතු යානයක් අපේ
ගෙදර මිදුලට ආවා ජෙනී
එකපාරටම සතුටු වුණා
වගේම දුකින් මාව
බදාගත්තා.




මම එම අඳුරු රැයේ
ඇයගෙන් ඇසුවේ මේ
යානය කුමක්ද අනේ
එවිට ඇයි කීවේ මේ
යානය ඇය රැගෙන
යාමට පැමිණි
අභ්‍යවකාශ යානාවක්
බවයි

මට ඒ අසා ගොඩක් දුක හිතෙනා එවිට
ඇය කීවේ නැවතත් මා බලන්න එන බවත්
යම් දවසක මා ඇයගේ ලෝකයට රැගෙන
ගොස් එහි විසිතුරු පෙන්වන බවයි. ඇය
මට අමුතු ලස්සන සෙල්ලම් බඩු ගොඩක්
තෑගි දී යන්න ගියා. ඇයගේ යානය
නොපෙනී යන තුරුම මම ජනේලය ළඟට
වී බලා සිටියා



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු ...

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක



2023 . 11 . 01